# විවිධ ව්‍යාපාරික ව්‍යවසායන් මත බදුකරණය

## AAT අදියර III

## CPT - සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

නුවන් සමීර
B.Sc. (Accountancy) Sp., CBA, ACCA Finalist

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

පරිච්ඡේදය 6

# විවිධ ව්‍යවසායන් මත බදුකරණය
# (Taxation of Miscellaneous Undertaking)

මෙම පරිච්ඡේදය යටතේ පහත ව්‍යවසායන් සම්බන්ධව බදුකරණය සිදු කරන ආකාරය පැහැදිලි කරයි.

- හවුල් ව්‍යාපාර (Partnership)
- භාර (Trust)
- ඒකකභාර (Unit Trust)
- රාජ්‍ය නොවන (NGO)
- පුණ්‍යායතන (Charity)

විෂය නිර්දේශයේ බර තැබීම 10%

## හවුල් ව්‍යාපාර බදුකරණය (Partnership Taxation)

දේශීය ආදායම් පනතේ 195 වගන්තිය අනුව බද්දට යටත් වන තැනැත්තන් පහත පරිදි වර්ග කළ හැකිය.

1. තනි පුද්ගලයින්
2. අස්තීත්ව
   - සමාගම්
   - හවුල් ව්‍යාපාර
   - භාර

හවුල් ව්‍යාපාර සඳහා නෛතික පුද්ගලභාවයක් නොමැති වුවද, බදු කාර්යය සඳහා හවුල් ව්‍යාපාරයේ ''අස්තීත්තවයක්'' ලෙස සැලකේ.

හවුල් ව්‍යාපාර යන්නෙන් ලිඛිතව සටහන් කරනු ලැබ තිබේද යන්න නොතකා, ලාභ ලැබීමේ අරමුණින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයන් හෝ සංස්ථා දෙකක් හෝ ඊට වැඩි ගණනකින් යුත් සංගමයක් අදහස් වේ.

නමුත් 195 වගන්තියේ අර්ථකතනයන්ට අනුව, අවම වශයෙන් හවුල්කරුවන් 20 දෙනෙකුවත් සිටින ව්‍යාපාර ණය සඳහා සීමිත වගකීමක් දරනු ලබන හවුල් ව්‍යාපාරයක්, සමාගමක් වශයෙන් සලකනු ලැබිය යුතුය.

හවුල් ව්‍යාපාර පහත ආදායම් මත පහත පරිදි බද්දට යටත් වේ.

- ආයෝජන වත්කම් උපලබ්ධි මත - 10%
- අනෙකුත් බදුවන (ආදායම මත - 6%(මෙහිදී රු. 1,000,000 ක බදු සහනයක් හිමි වේ)

හවුල් ව්‍යාපාරයක, බදුවන ලාභය ගණනයේ දී පහත දෑ ලාභයෙන් අඩු කිරීමට ඉඩ නොදේ.

(a) හවුල්කරුවෙකු විසින් හවුල් ව්‍යාපාරයකට ලබා දුන් ණය සඳහා පොලී, ප්‍රාග්ධන පොලී

(b) හවුල්කරුවෙකු හවුල් ව්‍යාපාරයෙන් ලබා ගන්නා හවුල් වේතන හෝ වෙනත් සේවා සැපයීම් මත ලැබෙන ලැබීම්.

| | (+) | (-) |
|---|---|---|
| හවුල් ව්‍යාපාර ලාභය | xxxx | |
| (+) ණය සඳහා පොලී | xxx | |
| (+) හවුල් වේතන (දූනට ලාභයෙන් අඩුකර ඇත්නම්) | xx | |
| ගිණුම්කරණ ක්ෂය | xxx | |
| ප්‍රාග්ධන දීමනාව | | (xxx) |
| | xxxx | xx |
| | (xx) | |
| හවුල් ව්‍යාපාර බදුවන ව්‍යාපාර ලාභය | xxx | |
| (+) ආයෝජන ආදායම් | xxx | |
| හවුල් ව්‍යාපාර බදුවන ආදායම | xxxx | |

**හවුල් ව්‍යාපාර බද්ද ගණනය,**

| | | | |
|---|---|---|---|
| බදුවන අදායම තුල ඇති ආයෝජන වත්කම් උපලබ්ධි ලාභය | (xxx) x | 10% | = xxx |
| ඉතිරි බදුවන ලාභය | (xxx – 1,000,000) x | 6% | = xxx |
| මුළු බදු වගකීම | | | = xxx |

❖ ඒ අනුව හවුල් ව්‍යාපාරයකට ඉතිරි බදුවන ලාභය මත රු. 1,000,000 බදු සහනයක් ඇත.

## ප්‍රශ්නය

A හා B යන AB හවුල් ව්‍යාපාරයේ සම හවුල්කරුවන්ය. A හා B පිළිවෙලින් මාසිකව 10,000 හා 15,000 ලෙස හවුල් වේතනය කොට හිමිකම් කියයි. තවද A විසින් රු. 2,000,000 ණය මුදලක් හවුල් ව්‍යාපාරයට ලබා දී ඇති අතර එය 10% පොලියක් වාර්ෂිකව හිමිකම් කියයි. වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ගිණුම්කරණ ලාභය රු. 2,200,000 කි. (ඉහත වියදමින් අඩු කල පසුව මේ තුල රු. 50,000 ට ඉඩමක් විකිණීමේ ලාභයද ඇතුලත් වේ.)

ඉඩම 2018/10/01 දින රු. 700,000 මිලදී ගෙන ඇති අතර එය 2020/21 තක්සේරු වර්ෂයේ රු. 1,000,000 කට විකුණා ඇත. විකිණීම සඳහා ප්‍රචාරණ දැන්වීමක් මත රු. 50,000 පිරිවැයක් ද, තැරැව් ගාස්තු ලෙස රු. 20,000 ක් ද දරා ඇත.

අවශ්‍ය දේ, 2020/2021 තක්සේරු වර්ෂයේ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම්.

JMC vLearning "your virtual learning partner"

## රාජ්‍ය නොවන සංවිධාන (Non Government Organizations)

195 වන වගන්තියට අනුව ''රාජ්‍ය නොවන සංවිධානයක්'' යනුවෙන් රාජ්‍ය නොවන ව්‍යාවසායෙන් යුතු, ස්වේච්ඡා පදනමක් මත එක් තැනැත්තෙක් හෝ තැනැත්තන් කණ්ඩායමක් විසින් පිහිටවනු ලැබේ.

(a) දුප්පත් හා අසරණ අයට රෝගී තැනැත්තන්ට, අනාථ දරුවන්ට, වැන්දඹුවන්ට, යෞවනයන්ට සහ ළමයින්ට සහන සැලසීම සඳහා හෝ

(b) ආදායම් බදු කොමසාරිස් විසින් රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස පිළිගනු ලබන සාමාන්‍යයෙන් අවශ්‍යතා ඇති අයට සහන සැලසීම සඳහා ස්ථාපිත කරනු ලබුවා වූ සහ පිහිටවනු ලැබුවා වූ සංවිධානයක් හෝ සංගමයක්.

(c) පුණ්‍යායතන ඇතුලත් නොවේ.

- 68 වන වගන්තියට අනුව රාජ්‍ය නොවන සංවිධානයක් විසින්, යම් තක්සේරු වර්ෂයක් තුළදී ප්‍රදාන පරිත්‍යාග දායක මුදල් හෝ වෙනත් යම් ආකාරයකින් ලැබුණු එවැනි මුදල්වලින් 3% ක් පමණක් 24% බදු අනුපාතයට යටත් වේ.
- ආයෝජන වත්කම් උපලබ්ධි කිරීම මත ලැබෙන ලාභය 10% බදු අනුපාතයට යටත් වේ.
- ඉහත දෑ වලට අමතරව රාජ්‍ය නොවන සංවිධානයක බදු අය කළ හැකි ආදායම මත 24% ක අනුප්‍රමාණයකින් බදු ගෙවිය යුතුය.

### ප්‍රශ්නය

XYZ රාජ්‍ය නොවන සංවිධානයට 2020/2021 තක්සේරු වර්ෂයේදී පහත ආදායම් ලැබී තිබේ.

| | |
|---|---|
| - විදේශ පරිත්‍යාග | රු.3,000,000 |
| - ස්ථාවර තැන්පතු මත පොලී | රු. 350,000 |
| - ප්‍රාග්ධන ලාභ | රු. 400,000 |

2020/21 තක්සේරු වර්ෂය සඳහා XYZ හි බදු වගකීම ගණනය කරන්න.

## පුණ්‍යනායතන (Charitable Institution)

195 වන වගන්තියට ආයතනය යන්නෙන්,
පුණ්‍ය කාර්යයක් සඳහා පමණක් පිහිටවනු ලැබූ හෝ හුදෙක් පුණ්‍ය කාර්යයක් කරගෙන යාමෙහිලා යෙදී සිටින යම් භාරයක, භාරකරුවෙකු හෝ භාරකරුවන් හෝ සංස්ථාවක් හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

- ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලැබීම් මත 10% අනුපාතය මත ද,
- ඉතිරි බදු අය කළ හැකි ආදායම මත 14% අනුප්‍රමාණයකින් බදු ගෙවිය යුතුය.

### විශේෂ

2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආගමික කටයුතු පිළිබඳ විෂයභාර අමාත්‍යාංශය සමඟ ලියාපදිංචි වී ඇති ඕනෑම ආගමික ආයතනයක් ලබන **ප්‍රදාන හෝ පරිත්‍යාග** ආදායම් බද්දෙන් සම්පූර්ණයෙන්ම නිදහස් කෙරේ.

### ප්‍රශ්නය

2020/2021 තක්සේරු වර්ෂයේ ABC පුණ්‍යායතනයට පහත අදායම් ලැබී තිබේ.

| | |
|---|---|
| කුලී ආදායම | - රු. 240,000 |
| ව්‍යාපාර ආදායම | - රු. 125,000 |
| ප්‍රාග්ධන ලාභ | - රු. 200,000 |
| පරිත්‍යාග | - රු. 300,000 |

**අවශ්‍ය දේ:**

2020/21 තක්සේරු වර්ෂය සඳහා මෙම පුන්‍යායතනයේ බදු වගකීම ගණනය කරන්න.

JMC vLearning "your virtual learning partner"

**සැකසුම: නුවන් සමීර**